# ස්ථාවර ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

**ආපදා ස්ථානීය අංක. 202**
**මොරවක අධිකරණ සංකීර්ණය**

**මාතර දිස්ත්‍රික්කය**

**2026 මැයි**


ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
ASIAN INFRASTRUCTURE INVESTMENT BANK
වෙනුවෙන්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු.ක. 011-2588946, 011-2503431, 0112-2500354
සකසන ලදී

පටුන


**1.** හැඳින්වීම ........ 1

1.1 ව්‍යාපෘති පසුබිම ........ 1

1.2 අපේක්ෂිත පරිශීලකයන් ........ 1

**2.** නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය ........ 1

2.1 ව්‍යාපෘතියේ නම ........ 1

2.2 ව්‍යාපෘති ස්ථානයේ පිහිටීම ........ 2

2.3 භූ ලක්ෂණ සහ ඉඩම් අයිතිය ........ 2

2.4 ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ (කොටපොල) ........ 3

**3.** සිදුවූ නායයෑම් උපද්‍රව පිළිබඳ තොරතුරු ........ 3

3.1 නායයෑම් ආපදාවේ ස්වභාවය ........ 3

3.2 නායයෑමෙන් සිදුව ඇති බලපෑම හා ප්‍රතිවිපාක ........ 3

3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්.ග ........ 4

3.4 ඉවත් කිරීම් ........ 4

3.5 නැවත පදිංචි කිරීම ප්‍රගතිය ........ 4

**4.** පාෂාණ කඩා වැටීම සිදුවන ප්‍රදේශය, ඊට යාබද ප්‍රදේශ සහ වර්තමාන අවදානම් මට්ටම පිළිබඳ විස්තරය ........ 6

4.1 නායයෑමේ ප්‍රදේශය ........ 6

4.2 පාෂාණ කඩා වැටීමේ ප්‍රදේශයට යාබද ප්‍රදේශය ........ 6

4.3 වර්.තමාන අවධානම් ස්වභාවය ........ 6

**5.** ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන් ........ 7

**6.** ව්‍යාපෘති ක්‍රියාවන් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී ඒකක පිළිබඳ විශේෂ සඳහනක් සහිත අවට පරිසරය පිළිබඳ කෙටි විස්තරයක් ........ 7

**7.** ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම ........ 8

7.1 හිතකර බලපෑම් ........ 8

7.2 අහිතකර බලපෑම් ........ 8

7.2.1 ජල විද්‍යාත්මක බලපෑම් ........ 9

7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාව කෙරෙහි බලපෑම ........ 9

7.2.1.2 ජල දූෂණය සහ මතුපිට ජලයේ ගුණාත්මකභාවය කෙරෙහි බලපෑම ........ 9

7.2.1.3 පාංශු ඛාදන බලපෑම් ........ 9

7.2.1.4 විවෘත මළපහ කිරීම සහ ජලයෙන් බෝවන ආසාදන ........ 9

7.2.1.5 පහළ ජල භාවිතයන් කෙරෙහි බලපෑම් ........ 9

7.2.1.6 භූගත ජල මට්ටමට හා භූගත ජලයේ ගුණාත්මකභාවයට බලපෑම් ........ 9

7.2.2 පාරිසරික බලපෑම් ........ 10

7.2.2.1 ශබ්දය හා කම්පන මගින් ඇති විය හැකි බලපෑම් ........ 10

7.2.2.2 වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම ........ 10

7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු ........ 10

7.2.2.4 පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය භාවිතය ........ 10

7.2.3 ජීව විද්‍යාත්මක /පරිසර විද්‍යාත්මක බලපෑම ........ 10

7.2.3.1 සැලකිය යුතු වනජීවී වාසස්ථානවල බලපෑම් ........ 10

7.2.3.2 සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි බලපෑම් ........ 10

7.2.4 සාමාජීය හා ආර්ථික බලපෑම් ........ 10

7.2.4.1 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම් ........ 10

7.2.4.2 කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිලි වල ඉරිතැලීම් විය හැකි බලපෑම ........ 10
7.2.4.3 භූමියට සහ අනාගත සංවර්ධන කටයුතුවලට ප්‍රවේශය අහිමි වීම ........ 10
7.2.4.4 ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ........ 10
7.2.4.5 සේවා සැපයීම කෙරෙහි ඇති වන බලපෑම (ජල සැපයුම, අපජලය, විදුලිය) ........ 11
7.2.4.7 කඳවුරු සහ ව්‍යාපෘති භූමිය ස්ථානගත කිරීමේ අවශ්‍යතා ........ 11
7.2.4.8 සහ කාර්ය මණ්ඩලය / ව්‍යාපෘති භූමිය අවට ජීවත් වන පුද්ගලයින් අතර සබඳතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව ........ 11
7.2.4.9 ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව ........ 11
7.2.4.10 ඉදිකිරීම් කටයුතු මගින් මහජනතාවට ඇතිවන ආරක්ෂාව: මගීන් සඳහා පවතින ඉහළ අවදානම ........ 11
**8.** ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය ........ 11
**9.** සැලකිය යුතු පාරිසරික හා සමාජ බලපෑම් ........ 12
9.1 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය :කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කරුණු ........ 12
9.2 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම ........ 12
**10.** පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESMP) ........ 12
10.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ........ 12
10.2 පදිංචි ජනතාව ඉවත් කිරීම ........ 12
10.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය) ........ 12
10.4 ව්‍යාපෘතිය ක්‍රියාමාර්ග හේතුවෙන් දේපල/භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ගෙවීම ........ 12
10.5 පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම ........ 12
10.6 සැළසුම් මත පදනම් වූ පාරිසරික සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම ........ 13
10.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම ........ 14
10.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන් ........ 14
10.7.2 නාය යන ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම ........ 15
10.7.3 ස්ථානයට අදාල විශේෂිත අධීක්ෂණ තත්ත්වයන් ........ 18
**11.** පදිංචි ජනතාව සහ පාර්ශවකරුවන්ගේ උපදේශන - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන් ........ 19
11.1 මහජන උපදේශන ........ 19
11.2 පාර්ශවකරුවන් සමග පවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකගතාවයන් හා නිර්දේශයන් ........ 19
**12.** ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යෝග්‍යතා , කැමැත්ත ප්‍රකාශනය , එකඟතාව සහ අනුමත කිරීම් ........ 19
12.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ........ 19
12.2 ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය ........ 19
12.3 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබාගැනීම/නෛතික බැදීම/ විරුද්ධත්වයක් නොමැති වීම ........ 20
**13.** දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය ........ 20
**14.** තොරතුරු අනාවරණය කිරීම ........ 20

ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම I: ව්‍යාපෘති ප්‍රදේශයේ සහ අදහස් විමසීම් සිදුකරණ අතරතුර ලබාගත් ඡායාරූප........................................i
ඇමුණුම II: පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු.........................................i
ඇමුණුම III: අධ්‍යන කණ්ඩායම..........................................................................................................................i
ඇමුණුම IV: යොමු ලැයිස්තුව..........................................................................................................................i

රූපසටහන් ලැයිස්තුව

රූපය 1: යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානයට පිවිසුම් මාර්ගය ........................................................ 2
රූපය 2: යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ හා අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් රූපය........................................................................................................................................ 3
රූපය 3: ගූගල් රූපය, හරස්කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප....... 5
රූපය 4a: අධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ දර්ශනය ................................................................................ 7
රූපය 4b: රැඳවුම් බිත්තිය සහ ඉහළ බෑවුම් ප්‍රදේශය .................................................................................... 7
රූපය 4c: අස්ථායී ඉහළ බෑවුම් ප්‍රදේශයේ දර්ශනය....................................................................................... 7
රූපය 4d: අධිකරණ සංකීර්ණයේ පිටුපස අවදානම් කලාපය............................................................................ 7
රූපය 4e: රැඳවුම් බිත්තියේ ඉරිතැලීම්.......................................................................................................... 8
රූපය 4f: අධිකරණ ගොඩනැගිල්ල පිටුපස රැඳවුම් බිත්තිය සහ ජලාපවහනය ................................................... 8
රූපය 4f: ප්‍රදේශයේ වෘක්ෂලතාදිය ................................................................................................................ 8
රූපය 4g: බිත්තියේ ඉරිතැලීම් ..................................................................................................................... 8

වගු ලැයිස්තුව

වගුව 1. සෘණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම........................................................................... 9
වගුව 2. ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය ................................................................................ 11
වගුව 3. සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම......................................................... 13
වගුව 4. පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන් ES & HS ... 14
වගුව 5. ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනු ලබන පියවර ................................................................ 16
වගුව 6: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර................................................................. 18
වගුව 7. බාධා ඉවත් කර ගැනීම්, විරෝධතා නොමැති බව, කැමැත්ත සහ අනුමත කිරීම් ................................. 19
වගුව 9. තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම ........................................................................... 21
වගුව 10. තොරතුරු රැස්කිරීම සඳහා සම්බන්ධ කරගත් ආයතන සහ නිලධාරීන්............................................ 21

## කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| DFC | වන සංරක්ෂණ  දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශිය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසරික හා සමාජ ආරක්ෂණය<br>Environmental Health & Social |
| E&SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ අංශයේ පාරිසරික සමාජ ඒකකය<br>Environmental & Social Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| SSE & SMP | ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමානාකරණ සැළසුම<br>Site Specific Environmental and Social Management Plan |
| ESMP | පාරිසරික හා සමාජ කළමනාකරණ සැළසුම<br>Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරී<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය<br>Geological Surveys & Mines Bureau |
| NBRO | ජාතික ගොඩනැගිලි  පර්යේෂණ  ආයතනය<br>National Building Research Institute |
| RHS | දකුණු පස<br>Right Hand Side |
| LHS | වම් පස<br>Left Hand Side |

# 1. හැඳින්වීම

## 1.1 ව්‍යාපෘති පසුබිම

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මූල්‍ය ආධාර මත, ස්ථාවර ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) යටතේ ශ්‍රී ලංකාවේ පළාත් 6 ක දිස්ත්‍රික්ක 13 ක නාය යෑම් සිදුවන ස්ථාන පිළිසකර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් AIIB බැංකුවේ හා ලංකා රජයේ නීතිරීතිවලට අනුකූලව සිදුවිය යුතුය. ව්‍යාපෘති යේ ස්වභාවය සහ එහි ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් AIIB බැංකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවක් (ESMF) සකසා ඇත.

පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවහි (ESMF) අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබද මාර්ගෝපදේශයන් සැපයීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (ජා.ගො.ප. ආ.) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරණු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව, ව්‍යාපෘතියට අදාල පාර්ශවයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික, සමාජ, සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්වයන් පිළිබද අවධානය යොමු කිරීම වැදගත් වේ. එමනිසා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජයීය ඇගයීම් සඳහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා (SSE & SMP) සකසා ඇත. එම ස්ථානයේ විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිළිබද සැළසුම් මගින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන්, සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්දයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබද ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබාදෙනු ඇත.

මෙම විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම RLVMMP යටතේ අවදානම අවම කිරීම සඳහා තෝරාගත්, **මාතර දිස්ත්‍රික්කයේ මොරවක අධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල පිටුපස, බෑවුම් බිඳවැටීමේ ප්‍රදේශය** සඳහා සකස් කර ඇත. ගැඹුරු පාරිසරික හා සමාජ අධ්‍යයනයකින් පසුව සකස් කර ඇති මෙම සැළසුම මගින් පහත කරුණු පිළිබඳව ඉහළ අවධානයක් යොමු කර ඇත.

i. ව්‍යාපෘතියට අදාල කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම.
ii. ව්‍යාපෘතිය හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම.
iii. හානිය අවම කරන පියවර යෝජනා කිරීම.
iv. මෙම ව්‍යාපෘතියට අදාල වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම.
v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර අදාළ පාරිසරික නියාමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම.

## 1.2 අපේක්ෂිත පරිශීලකයන්

යෝජිත ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිසරික හා සමාජීයගැටළු, සහ නාය යාම අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ගැඹුරු අවබෝධයක් මෙම වාර්තාවෙන් සපයන අතර නායයෑම් අවම කිරීමේ සැලසුම් කණ්ඩායම, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති යේ පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවෙහි අඩංගු සංරචක, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කිරීමට අදහස් කරයි. නිශ්චිත පාරිසරික කළමනාකරණ සැලසුම ව්‍යාපෘති වෙබ් අඩවියේ ( https://rlvmmp.lk/) ප්‍රකාශයට පත් කරණු ලබන අතර මේ සම්බන්ධයෙන් පුළුල් පරාසයක උනන්දුවක් දක්වන පාර්ශවයන්ට (පොදු ජනතාව, වෙනත් ආයතන/සංවිධාන) පරිශීලනය කල හැක. කොන්ත්‍රාත්කරුවන්ටද වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති මෙම ස්ථානීය පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESPM) පරිශීලනය කර, ඔවුන්ගේ ස්ථානීය පාරිසරික හා සාමාජීය කළමනාකරණ ක්‍රියාකාරී සැළැස්ම (SSE-SMAP) සකස් කිරීමේ පදනම ලෙස යොදාගත හැක.

# 2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය

## 2.1 ව්‍යාපෘතියේ නම

**ආපදා ස්ථානීය අංක 202**, මාතර දිස්ත්‍රික්කයේ මොරවක අධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල පිටුපස, බෑවුම් බිඳවැටීමේ ප්‍රදේශය

## 2.2 ව්‍යාපෘති ස්ථානයේ පිහිටීම

යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කොටපොළ දකුණ (242/A) ග්‍රාම නිලධාරී වසමට අයත් වේ.

ස්ථානීයයේ GPS ඛන්ඩාංක - 6.282210°N සහ 80.545877 °E

ආපදා ස්ථානයට ආසන්නතම නගරය – කොටපොල යනු ළඟම නගරය වන අතර එය ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා නගරයකි. ආපදා අවම කිරීමේ ස්ථානය, කොටපොල නගරයේ සිට කිලෝමීටර 2.0 ක් පමණ දුරින් සහ ප්‍රසිද්ධ ආගමික ස්ථානයක් වන ගැටබරුව රජ මහා විහාරයේ සිට කිලෝමීටර 2.5 ක් පමණ දුරින් අධිකරණ සංකීර්ණයේ පිහිටා ඇත. ගාල්ල - දෙණියාය - මාදම්පේ අධිවේගී මාර්ගයට (A17) සම්බන්ධ කුඩා ප්‍රවේශ මාර්ගයක් හරහා මෙම ස්ථානයට ප්‍රවේශ විය හැකිය. *යොමු රූපය 1: ආපදා අවම කිරීමේ ස්ථානයට ප්‍රවේශ වීමේ සිතියම*




රූපය 1: යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානයට පිවිසුම් මාර්ගය

## 2.3 භූ ලක්ෂණ සහ ඉඩම් අයිතිය

යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය කොටපොල නගරයේ සිට කිලෝමීටර 2.0 ක් පමණ දුරින්, මධ්‍යනා මුහුදු මට්ටමේ සිට මීටර් 200-400 ක උන්නතාංශයක පිහිටා ඇත. මෙම බෑවුම් බිඳවැටීමේ ප්‍රදේශය ආසන්න වශයෙන් මීටර් 30 ක් දක්වා විහිදේ. ඉඩම් හිමිකාරිත්වය අනුව, බෑවුම් බිඳවැටීමේ ප්‍රදේශය සහ පහළ බෑවුම් ප්‍රදේශය යන ද්විත්වයම කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වන අතර බෑවුමට ඉහළ ප්‍රදේශයේ පිහිටා ඇත්තේ, තේ සහ කුරුඳු වගා කරන පෞද්ගලික භූමියකි. *යොමු රූපය 2: යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ හා අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් රූපය.*




රූපය *2:* යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ හා අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් රූපය.

### 2.4 ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ (කොටපොල)

වාර්ෂික දල වර්ෂාපතනය – 2,524 මි.මී - 3,771 මි.මී
වාර්ෂික දල උෂ්ණත්වය – 25.31ºC- 30.75ºC

### 2.5 ප්‍රදේශයේ ජන විකාශන ලක්ෂණ

ශ්‍රී ලංකාවේ සංගණන හා සංඛ්‍යාලේඛන වාර්තා (2024) අනුව, ආපදා අවම කිරීමේ ස්ථානය කොටපොල දකුණු (242/A) ග්‍රාම නිලධාරී වසමට අයත් වන අතර එහි ජනගහනය 1675 කි (කාන්තා: 871; පිරිමි: 804). (මූලාශ්‍රය: https://www.statistics.gov.lk/Population/StaticalInformation/GNDReports#)

## 3. සිදුවූ නායයෑම් උපද්‍රව පිළිබඳ තොරතුරු

### 3.1 නායයෑම් ආපදාවේ ස්වභාවය

මොරවක අධිකරණ ගොඩනැගිල්ල පිටුපස බෑවුමේ අස්ථාවරත්වයට ප්‍රධාන හේතුව බෑවුමෙහි අනාරක්ෂිත සිරස් ඛණ්ඩිය සහ තෙමහල් අධිකරණ ගොඩනැගිල්ල සඳහා ඉහළ රඳවුම් පවුරක් ඉදිකිරීමයි. අධිකරණ සංකීර්ණය සඳහා ඉදිකිරීම් කටයුතු 2015 දී ආරම්භ විය. වසර කිහිපයකට පසු, බෑවුම් බිඳ වැටීම් සහ රඳවුම් බිත්තියේ ඉරිතැලීම් ඇතිවීම ඇතුළු අස්ථාවර වීමේ සලකුණු මතු වීම ආරම්භ වී ඇත. මෙම තත්වයන් ප්‍රදේශය තුළ නායයෑම් අවදානම ඉහළ යෑම පෙන්නුම් කරන ලදි.

බෑවුම අස්ථාවර වීමේ අවදානම හේතුවෙන්, පූර්වාරක්ෂාවක් ලෙස අධිකරණ සංකීර්ණයේ කටයුතු 2020 වර්ෂයේ දී අත්හිටුවන ලදි. ඉන්පසුව, අධිකරණ කටයුතු ගැටබරුව රජ මහා විහාරය අසල වෙනත් ගොඩනැගිල්ලකට තාවකාලිකව ස්ථානගත කරන ලදී. *යොමු රූපය 3: ගූගල් රූපය, හරස්කඩ, ඉඩම් පරිහරණය, අවදානම් මූලිකාංග සහ ස්ථානයේ ඡායාරූප*

### 3.2 නායයෑමෙන් සිදුව ඇති බලපෑම හා ප්‍රතිවිපාක

මොරවක අධිකරණ සංකීර්ණය පිටුපස ඇති බෑවුම බිඳවැටීම හේතුවෙන්, බරපතල බලපෑම් සහ ප්‍රතිවිපාක ගොඩනැගිල්ලට, අවට පරිසරයට සහ මහජන ආරක්ෂාවට ඇති විය හැකිය. පස චලනය සහ බෑවුම අස්ථාවර වීමෙන් බිත්තිවල ඉරිතැලීම්, අත්තිවාරම ගිලා බැසීම, ව්‍යුහාත්මක මූලද්‍රව්‍ය විරූපණය වීම සහ තෙමහල් අධිකරණ ගොඩනැගිල්ලේ සමස්ත ස්ථායිතාව දුර්වල වීම සිදු විය හැකිය. අස්ථායී බෑවුම සහ නායයෑම් ඇතිවීමේ හැකියාව විනිසුරුවරුන්ට, අධිකරණ කාර්ය මණ්ඩලයට, නීතිඥයින්ට, පොලිස් නිලධාරීන්ට සහ අධිකරණ පරිශ්‍රයට පැමිණෙන සාමාන්‍ය ජනතාවට සැලකිය යුතු තර්ජනයක් ඇති කරයි. අනතුරක් හෝ ජීවිත හානි සිදු වීමට සුන්බුන් බිඳවැටීම හෝ හදිසි බෑවුම් බිඳවැටීම හේතු විය හැක. ආරක්ෂක ගැටළු හේතුවෙන්, අධිකරණ කටයුතු අත්හිටුවා තාවකාලිකව වෙනත් ස්ථානයකට ගෙන යාමට සිදු විය. ජලාපවහන පද්ධති, ප්‍රවේශ මාර්ග,

උපයෝගිතා මාර්ග සහ අවට ගොඩනැගිලි වැනි යටිතල පහසුකම් සහ රැඳවුම් බිත්තිය බැවුම් චලනය හේතුවෙන් හානි විය හැකිය.

3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග

අධිකරණ අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI) නිලධාරීන් විසින් මෙම ස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදී. එම පරීක්ෂණයේ ප්‍රධාන අරමුණ වූයේ බැවුම් අස්ථාවර වීම හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම් පිළිබඳ මූලික ඇගයීමක් සිදු කිරීම, දැනට පවතින ස්ථානීය තත්ත්වයන් විමර්ශනය කිරීම සහ දිගුකාලීන නායයෑම් අවම කිරීමේ හා ස්ථායීකරණ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍යතා හඳුනා ගැනීමයි.

3.4 ඉවත් කිරීම්

ආපදා අවම කිරීමේ ප්‍රදේශයේ ඉහළ අවදානම හේතුවෙන් ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලදී. යෝජිත ආපදා අවම කිරීමේ කටයුතු අවසන් වූ පසු, මොරවක අධිකරණ සංකීර්ණය පහසුකම් සහ ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම මඟින් දෛනික මෙහෙයුම් සඳහා ආසන්න වශයෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් 50 දෙනෙකු, නීතිඥයින් 30 දෙනෙකු සහ සේවාදායකයින් 300-500 දෙනෙකු සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.5 නැවත පදිංචි කිරීම ප්‍රගතිය

මෙම ආපදා අවම කිරීමේ ස්ථානය සඳහා ව්‍යාපෘති-පාදක නැවත පදිංචි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවේ.




*රූපය 3: ගුගල් රූපය, හරස්කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප.*

4. පාෂාණ කඩා වැටීම සිදුවන ප්‍රදේශය, ඊට යාබද ප්‍රදේශ සහ වර්තමාන අවදානම් මට්ටම පිළිබඳ විස්තරය

4.1 නායයෑමේ ප්‍රදේශය

අවදානමට ලක්ව ඇති ප්‍රදේශය තුළ තෙමහල් අධිකරණ ගොඩනැගිල්ල සහ අධිකරණ සංකීර්ණයට අයත් අවට පරිශ්‍රය ඇතුළත් වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI) භූ විද්‍යාඥයන් විසින් සිදුකරන ලද තක්සේරුව අනුව, රඳවුම් බැම්මට පසුපසින් ඇතිවී තිබෙන බෑවුම් අස්ථාවරතාව හේතුවෙන් මෙම තෙමහල් අධිකරණ ගොඩනැගිල්ල ඉහළ මට්ටමේ නායයෑම් අවදානමකට නිරාවරණය වී ඇත.

රඳවුම් බැම්ම සහ අධිකරණ ගොඩනැගිල්ල යන දෙකෙහිම ස්ථාන කිහිපයක ව්‍යුහාත්මක ඉරිතැලීම් නිරීක්ෂණය වූ අතර, එම තත්ත්වය බෑවුම් අස්ථාවරතාව සමඟ සම්බන්ධිත ව්‍යුහාත්මක පීඩන තත්ත්වයක් පෙන්නුම් කරයි. තවද, අස්ථාවර බෑවුම් කොටසට ඉහළින් පිහිටි ප්‍රදේශවල භූමියේ ආතති ඉරිතැලීම් (Ground Tension Cracks) ද හඳුනාගෙන ඇති අතර, එමගින් භූ ස්කන්ධයේ අඛණ්ඩ චලනයක් සහ අනාගතයේ නායයෑම් සිදුවීමේ හැකියාව තවදුරටත් තහවුරු වේ. මෙම තත්ත්වය හේතුවෙන් අධිකරණ කාර්ය මණ්ඩලය මෙන්ම අධිකරණ පරිශ්‍රය භාවිත කරන මහජනතාවද විශේෂයෙන්ම අධික වර්ෂාපතනය සහ අයහපත් කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවලදී සැලකිය යුතු අවදානමකට නිරාවරණය වී ඇත.

රඳවුම් බැම්ම ආසන්නයෙන් ජල සැපයුම් නල පද්ධති ද පිහිටා ඇති බව නිරීක්ෂණය වී ඇත. අස්ථාවර බෑවුම් කොටසට ඉහළින් පිහිටි භූමි ප්‍රදේශය ප්‍රධාන වශයෙන් කුරුඳු හා තේ වගාබිම්වලින් සමන්විත වන අතර, මතුපිට ජලාපවහන රටාවේ සහ පසෙහි ස්ථායීතාවයේ සිදුවන වෙනස්කම් හරහා මෙම භූමි භාවිත රටාවන් ද බෑවුමේ ස්ථායීතාවයට බලපෑම් කර ඇති විය හැකිය.

4.2 පාෂාණ කඩා වැටීමේ ප්‍රදේශයට යාබද ප්‍රදේශය

නායයෑම් අවදානමට ලක්ව ඇති ප්‍රදේශයට යාබදව පිහිටි භූමි ප්‍රදේශය, අධිකරණ සංකීර්ණය ද ඇතුළුව, ක්‍රියාකාරී, ආගමික හා ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන කිහිපයකින් සමන්විත වේ. කොටපොල නගරය අධිකරණ සංකීර්ණයේ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 2.0ක දුරකින් පිහිටා ඇති අතර, ප්‍රසිද්ධ ආගමික ස්ථානයක් වන ගැටබරු රජමහා විහාරය බලපෑමට ලක්ව ඇති ප්‍රදේශයේ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 2.5ක දුරින් පිහිටා ඇත.

ගැටබරු රජමහා විහාරය මාතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමකින් යුත් ප්‍රමුඛ ආගමික ස්ථානයක් ලෙස සැලකේ. අවට ප්‍රදේශවලින් පැමිණෙන විශාල බැතිමතුන් පිරිසක් විවිධ පුද්ගලික හා සමාජීය කටයුතු සඳහා ආශිර්වාද ලබා ගැනීම සහ ආගමික වතාවත්වල නිරත වීම සඳහා මෙම විහාරස්ථානය වෙත පැමිණෙති.

අස්ථාවර බෑවුම වටා පිහිටි ඉහළ බෑවුම් හා පහළ බෑවුම් ප්‍රදේශ විවිධ භූමි භාවිත රටාවන්ගෙන් සමන්විත වන අතර, ඒවාට කුරුඳු වගාබිම්, තේ වතු, ගෙවතු සහ මිශ්‍ර ශාක ආවරණ ඇතුළත් වේ. මෙම භූමි භාවිත රටාවන් ප්‍රදේශයේ මතුපිට ජලාපවහන තත්ත්වයන්ට මෙන්ම බෑවුම් ස්ථායීතාවයේ ලක්ෂණවලට ද බලපෑම් ඇති කළ හැකිය. *යොමු රූපය 3: ස්ථානයේ භූමි භාවිතය, අවදානම් මූලද්‍රව්‍ය සහ විශේෂ ලක්ෂණ නිරූපණය කරන ඡායාරූප ඇතුළත් ගූගල් සිතියම් රූප*

4.3 වර්තමාන අවධානම් ස්වභාවය

මොරවක අධිකරණ සංකීර්ණයට පසුපසින් පිහිටි ප්‍රදේශයේ බෑවුමේ අඛණ්ඩ අස්ථාවරතාව සහ භූමියේ හා ව්‍යුහයන්හි නිරීක්ෂණය වන විකෘතිකරණ ලක්ෂණ හේතුවෙන් අවට ප්‍රජාව සඳහා වර්තමාන අවදානම් මට්ටම, තවදුරටත් සැලකිය යුතු මට්ටමක පවතී. රඳවුම් බැම්ම, අධිකරණ ගොඩනැගිල්ල සහ ඉහළ බෑවුම් ප්‍රදේශයේ භූමිය තුළ නිරීක්ෂණය වී ඇති ඉරිතැලීම්, බෑවුමේ අඛණ්ඩ චලනයක් සිදුවන බවත්, විශේෂයෙන් අධික වර්ෂාපතනය සහ අයහපත් කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවලදී තවදුරටත් බෑවුම් බිඳ වැටීමේ අවදානමක් පවතින බවත් පෙන්නුම් කරයි. මෙම අවදානම අධිකරණ පරිශ්‍රයට පමණක් සීමා නොවන අතර, අවට පිහිටි නිවාස, වගාබිම්, ප්‍රවේශ මාර්ග සහ මහජන රැස්වීම් සඳහා භාවිත වන ස්ථාන ද නායයෑම් ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකිය. එබැවින්, අවට ප්‍රජාව හා යටිතල පහසුකම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා බෑවුම් තත්ත්වය පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය, කාර්යක්ෂම ජලාපවහන කළමනාකරණය, සුදුසු බෑවුම් ස්ථායීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අනාරක්ෂිත භූමි භාවිත ක්‍රියාකාරකම් පාලනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, මෙම ස්ථානය ආශ්‍රිත නායයෑම් අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

5. ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන්

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ මොරවක අධිකරණ සංකීර්ණය තුළ නැවත නැවතත් සිදුවන බාධා අවම කරමින් සහ අනාගතයේදී වඩාත් ආරක්ෂිත සහ ස්ථාවර පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු බෑවුම් ස්ථායීකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීමයි.

6. ව්‍යාපෘති ක්‍රියාවන් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී ඒකක පිළිබඳ විශේෂ සඳහනක් සහිත අවට පරිසරය පිළිබඳ කෙටි විස්තරයක්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවදානමට ලක්ව ඇති කොටස් සහ සේවාවන් නම්;

i. අධිකරණ තෙමහල් ගොඩනැගිල්ල
ii. මාර්ග තදබදය, මගීන් සහ පදිකයින්
iii. කාර්ය මණ්ඩලය (ස්ථිර සහ තාවකාලික) සහ අධිකරණ සංකීර්ණයේ සිටින මහජනතාව
iv. ඉහළ බෑවුමේ කුරුඳු සහ තේ වගාව
v. අධිකරණ සංකීර්ණයේ වත්මන් සේවාවන්

*(යොමු රූපය.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංවේදී අංග සහ ආපදා අවම කිරීමේ අඩවියේ හානියට පත් අංග)*

| | |
|---|---|
|  |  |
| *රූපය 4a: අධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ දර්ශනය* | *රූපය 4b: රැඳවුම් බිත්තිය සහ ඉහළ බෑවුම් ප්‍රදේශය* |
|  |  |
| *රූපය 4c: අස්ථායී ඉහළ බෑවුම් ප්‍රදේශයේ දර්ශනය* | *රූපය 4d: අධිකරණ සංකීර්ණයේ පිටුපස අවදානම් කලාපය* |



රූපය 4e: රැඳවුම් බිත්තියේ ඉරිතැලීම්



රූපය 4f: අධිකරණ ගොඩනැගිල්ල පිටුපස රැඳවුම් බිත්තිය සහ ජලාපවහනය



රූපය 4g: ප්‍රදේශයේ වෘක්ෂලතාදිය



රූපය 4h: බිත්තියේ ඉරිතැලීම්

*රූපය 4*: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංවේදී අංග සහ ආපදා අවම කිරීමේ අඩවියේ හානියට පත් අංග

## 7. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම

### 7.1 හිතකර බලපෑම්

අස්ථාවර බෑවුම් සඳහා යෝජිත ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මගින් දැනට පවතින බෑවුම් බිඳ වැටීම ස්ථායීකරණය කිරීමට සහ රැඳවුම් බැම්ම් පද්ධතියේ ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීමට හැකි වන අතර, එමගින් අධිකරණ සංකීර්ණ පරිශ්‍රයේ සමස්ත ආරක්ෂාව සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇත. ඒ අනුව, තෙමහල් අධිකරණ ගොඩනැගිල්ල, අධිකරණ කාර්ය මණ්ඩලය සහ පරිශ්‍රය භාවිත කරන මහජනතාව බෑවුම් අස්ථාවරතාව හා නායයෑම් ආශ්‍රිත අවදානම්වලින් ආරක්ෂා කර ගැනීමට හැකි වනු ඇත. තවද, ආසන්න මාර්ග භාවිත කරන මගීන් සහ පදිකයන් මෙන්ම අවට නිවාසවල පදිංචිකරුවන්, ඔවුන්ගේ වගාබිම් සහ අනෙකුත් දේපළ ද අනාගතයේදී සිදුවිය හැකි බෑවුම් චලනයන් හේතුවෙන් ඇතිවිය හැකි හානි සහ අවදානම්වලින් ආරක්ෂා වනු ඇත. එසේම, නිසි බෑවුම් ස්ථායීකරණ ක්‍රියාමාර්ග සහ කාර්යක්ෂම ජලාපවහන පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රදේශය තුළ අනාගතයේදී නායයෑම් සිදුවීමේ අවදානම සැලකිය යුතු ලෙස අවම කිරීමට හැකි වේ.

### 7.2 අහිතකර බලපෑම්

එම පාෂාණ බිඳ වැටීම සිදු වන භූමි ප්‍රදේශය තුලට පමණක් ආපදා අවම කිරීමේ කටයුතු සීමා වේ. එබැවින් සෘණාත්මක බලපෑම් එම ස්ථානයට පමණක් බොහෝ විට සීමා වනු ඇති අතර ඉදිකිරීම් කාලයට පමණක් සීමා වේ.

වගුව 1.  සෘණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම

| **ඉදිකිරීම් කාලය තුළ විය හැකි බලපෑම් නිර්ණායක** | **බලපෑම් මට්ටම** |
|---|---|
| 7.2.1 ජල විද්‍යාත්මක  බලපෑම් | |
| 7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාව කෙරෙහි බලපෑම<br>මෙම ස්ථානයේ යෝජිත ආපදා අවම කිරීමේ කටයුතු ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ අස්ථාවර ඉහළ බෑවුම් ප්‍රදේශය ස්ථායීකරණය කිරීම කෙරෙහි ය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ ප්‍රදේශයේ දැනට පවතින මතුපිට හා භූගත ජලාපවහන රටාවන්හි යම් වෙනස්කම් ඇතිවිය හැකි බව අපේක්ෂා කෙරේ. යෝජිත ඉංජිනේරු සැලසුම්වල බහුතරයක් මතුපිට සහ භූගත ජලාපවහන කළමනාකරණය ඇතුළත් වන අතර, ඒ සඳහා මතුපිට හා භූගත ජලය ඉවත් කිරීමේ ක්‍රියාමාර්ග  ක්‍රියාත්මක කිරීමට නියමිතය. එබැවින්, විශේෂයෙන් වර්ෂා සමයේදී අධික ජල ප්‍රවාහයක් ඇතිවිය හැකි අතර, දැනට පවතින ජලාපවහන පද්ධතිවල ජල පිරී ඉතිරී යාමේ තත්ත්වයන් ද ඇතිවිය හැකිය. තවද, අස්ථාවර බෑවුම් කොටස හරහා ගලා යන ජල ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් එම ප්‍රදේශයේ බෑවුම් බිඳ වැටීම් හා නායයෑම් අවදානම තවදුරටත් තීව්‍ර වීමේ හැකියාවක් පවතී. මෙය **අතිශයින් වැදගත්** බලපෑමක් ලෙස සැලකේ. | **අතිශයින් වැදගත්** |
| 7.2.1.2 ජල දූෂණය සහ මතුපිට ජලයේ ගුණාත්මකභාවය කෙරෙහි බලපෑම<br>බෑවුම් කැණීමේදී, සුන්බුන් සහ පාෂාණ ඉවත් කිරීමෙන් අධික අවසාදිත ගලායාමක් ඇති විය හැකි අතර, දූෂිත මතුපිට ජලය ගලායාමෙන් ජලය දූෂණය විය හැකිය. තෙල් සහ අනෙකුත් හානිකර ද්‍රව්‍ය/දූෂක යන්ත්‍රෝපකරණවලින් නුසුදුසු ලෙස බැහැර කිරීම, තාවකාලික ගබඩා ටැංකිවලින් කාන්දු වීම, ඝන අපද්‍රව්‍ය සහ අපජලය හේතුවෙන් ජලයේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් ඇති විය හැක. අසල ජල ධාරාවන් නොමැති බැවින්, ජල දූෂණය සහ මතුපිට ජලයේ ගුණාත්මක භාවයට ඇති කරන බලපෑම් නොවැදගත් ලෙස සැලකේ. | නොවැදගත් |
| 7.2.1.3 පාංශු ඛාදන බලපෑම්<br>ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඉදිකිරීම් අවධියේදී බෑවුම් මතුපිට කොටස් නිරාවරණය වන බැවින්, පාංශු ඛාදනය සිදුවීමේ හැකියාව වැඩි වේ. එසේම, ප්‍රදේශයේ දැනට පවතින මතුපිට සහ භූගත ජලාපවහන රටාවන් මෙන්ම හානිවී ඇති ජලාපවහන පද්ධති ද ඉදිකිරීම් කටයුතු හේතුවෙන් බාධාවට ලක්විය හැකිය. එබැවින්, පාංශු ඛාදන බලපෑම් වැදගත් ලෙස සැලකේ. | වැදගත් |
| 7.2.1.4 විවෘත මළපහ කිරීම සහ ජලයෙන් බෝවන ආසාදන<br>අධිකරණ සංකීර්ණය අවට ප්‍රදේශය අධික ඝනත්වයකින් යුත් වෘක්ෂලතා ආවරණයකින් සමන්විත නොවන බැවින්, ඉදිකිරීම් කාලය තුළ සේවකයන් විසින් විවෘත ස්ථානවල මළපහ කිරීම, සිදුවීමේ අවදානම ඉතා අවම ලෙස සැලකේ. එමෙන්ම, විවෘත ස්ථානවල මළපහ කිරීම හේතුවෙන් ජලධාරාවලට මළ ද්‍රව්‍ය මගින් ඇතිවන දූෂණය, කොන්ත්‍රාත්කරුගේ ශ්‍රම බලකාය විසින් ඉදිකිරීම් අවධියේදී සිදුවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. | නොවැදගත් |
| 7.2.1.5 පහළ ජල භාවිතයන් කෙරෙහි බලපෑම්<br>ආපදා අවම කිරීමේ ප්‍රදේශවල ස්වාභාවික ජල උල්පතක් ඇති බැවින්, ජල සම්පතට පාෂාණ හෝ අවසාදිත එකතු වීමේ බලපෑම නොවැදගත් ලෙස සැලකේ . | නොවැදගත් |
| 7.2.1.6 භූගත ජල මට්ටමට හා භූගත ජලයේ ගුණාත්මකභාවයට බලපෑම්<br>ඉදිකිරීම් ද්‍රව්‍ය වන සිමෙන්ති සහ ග්‍රවුට් වැනි ද්‍රව්‍ය භූගත ජලයට එකතුවීම  හෝ මිශ්‍රවීම  නිසා ජලයේ ගුණාත්මක භාවය  තාවකාලිකව පහත වැටෙන අතර අහිතකර ද්‍රව්‍ය එකතුවීමක්ද සිදුවේ. ඉදිකිරීම් සිදුකරන කාලය තුල රසායනික ද්‍රව්‍ය නිසා ඇතිවන අනතුරුදායක අපද්‍රව්‍ය, ඉදිකිරීම් වලින් පිටවන අපජලය සහ  ස්ථානීය වැසිකිලි පද්ධති වලින් පිටවන අපද්‍රව්‍ය නිසා භූගත ජලයේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් ඇති කරයි. ඊට අමතරව, බෑවුම් ප්‍රදේශයේ සිදු කරනු ලබන ආපදා අවම කිරීමේ ක්‍රියාකාරකම් භූගත ජල ගුණාත්මක භාවයට බලපෑ හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස භූගත ජල මට්ටම පහත වැටීමට ඉඩ ඇත. | වැදගත් |
| 7.2.1.7 ජලය හෝ තෙත් බිම් මත බලපෑම්<br>යන්ත්‍රෝපකරණ සහ වැඩබිම් වලින් තෙල්, රසායනික ද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍ය හෝ අපජලය නුසුදුසු ලෙස බැහැර කිරීම මෙන්ම තාවකාලික ගබඩා ටැංකිවලින් කාන්දු වීම නිසා බෑවුමේ පාමුල බෝක්කුව හරහා ගලා යන මතුපිට අපජලය දූෂණය විය හැකි අතර, එය බැහැර කිරීමේ ස්ථානයේ ජලයේ ගුණාත්මක භාවයට අහිතකර ලෙස බලපායි. | වැදගත් |

| | |
|---|---|
| 7.2.2 පාරිසරික බලපෑම් | |
| 7.2.2.1 ශබ්දය හා කම්පන මගින් ඇති විය හැකි බලපෑම්<br><br>ඉදිකිරීම් උපකරණ වලින් ශබ්දය සහ කම්පනය අපේක්ෂා කෙරේ. ඉදිකිරීම් කටයුතු අතරතුර ශබ්දය සහ කම්පන බලපෑම් ඉතා වැදගත් වේ. අධිකරණ සංකීර්ණයේ කාර්යයන් තාවකාලිකව වෙනත් ස්ථානයකට ඉවත් කරනු ලැබුවද, දැනට රාජකාරියේ යෙදී සිටින සහ ගොඩනැගිලිවල රැඳී සිටින නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක නිලධාරීන් කිහිප දෙනෙකුට සැලකිය යුතු ලෙස බලපෑම් ඇති විය හැකිය. දිවා කාලයේ යන්ත්‍රෝපකරණ සහ රථ වාහන ක්‍රියාත්මක කිරීම අසල නිවාසවල පදිංචිකරුවන්ට බාධාවක් විය හැකිය. | **අතිශයින් වැදගත්** |
| 7.2.2.2 වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම<br><br>වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් ලෙස: ඉඩම් එළිපෙහෙළි කිරීම, ඩීසල් එන්ජින් ක්‍රියාත්මක කිරීම, කඩා ඉවත් කිරීම සහ පිළිස්සීම ඇතුළත් වේ. ඉදිකිරීම් අතරතුර, එය සාමාන්‍යයෙන් කොන්ක්‍රීට්, සිමෙන්ති, දැව, පාෂාණ සහ සිලිකා වලින් ඉහළ මට්ටමේ දූවිලි ජනනය කරයි. ඉදිකිරීම් වලින් සිදුවන වායු දූෂණය නිලධාරීන්හට බලපෑම් ඇති කල හැකිය. ගමන් කරන වාහන (බස් රථ, බයිසිකල්, ලොරි, ට්‍රක් රථ, ටිපර්, ත්‍රිරෝද රථ) සඳහා මාර්ගය බහුලව භාවිතා වේ. වායු දූෂණය අවට පදිංචිකරුවන්ට, සහ පදිකයින්ට සැලකිය යුතු බලපෑමක් විශේෂයෙන් වියළි කාලවලදී ඇති කළ හැකිය. | **අතිශයින් වැදගත්** |
| 7.2.2.3 ඝන අපද්‍රවය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු<br><br>ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම; ව්‍යාපෘති ස්ථානය අවට ජනනය අපද්‍රව්‍ය, ආහාර අපද්‍රව්‍ය, ඉදිකිරීම් අපද්‍රව්‍ය වැනි විවිධ වර්ගවල අපද්‍රව්‍ය ගබඩා කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කල හැකිය. අධිකරණ පරිශ්‍රය තුළ සහ ඒ අවට කසළ බැහැර කිරීම, අනවසරයෙන් ගබඩා කිරීම සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් සේවකයින් සහ අසල්වැසි ප්‍රජාව සඳහා අපහසුතා ඇති කරයි. අපද්‍රව්‍ය මගින් පස දූෂණය විය හැකි අතර ඉදිකිරීම් කාලය තුළ නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් විවිධ පාරිසරික බලපෑම් ඇති විය හැකිය. | වැදගත් |
| 7.2.2.4 පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය භාවිතය<br><br>බලපෑමට ලක් වූ ප්‍රදේශයේ විශාල පාෂාණ නොමැති බැවින්, පාෂාණ පිපිරවීම අවශ්‍ය නොවේ. | නොවැදගත් |
| 7.2.3 ජීව විද්‍යාත්මක /පරිසර විද්‍යාත්මක බලපෑම | |
| 7.2.3.1 සැලකිය යුතු වනජීවී වාසස්ථානවල බලපෑම්<br><br>ව්‍යාපෘති භූමියට ආසන්නව හෝ ව්‍යාපෘතිය තුළ ඇති වනාන්තර ප්‍රදේශ බලපෑමට ලක්වන ප්‍රදේශයක් නොවේ. එබැවින්, ඉහළ ශබ්ද උත්පාදන ක්‍රියාකාරකම් වැනි ඉදිකිරීම් කටයුතු හේතුවෙන් වැදගත් වනජීවී වාසස්ථානවලට බලපෑමක් සිදු නොවිය හැකිය. | නොවැදගත් |
| 7.2.3.2 සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි බලපෑම්<br><br>මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන ශාක බොහොමයක් ආවේණික නොවන, තර්ජනයට ලක්වන සහ IUCN හි රතු ලැයිස්තුවේ හඳුනාගත් ශාක නොමැත. එබැවින්, වැදගත් සත්ත්ව හා ශාක විශේෂවලට බලපෑමක් සිදු නොවිය හැකිය. | නොවැදගත් |
| 7.2.4 සාමාජීය හා ආර්ථික බලපෑම් | |
| 7.2.4.1 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම්<br><br>ව්‍යාපෘති භූමියට ආසන්න ප්‍රදේශයට යාබදව කුරුඳු සහ තේ වගාවන් ඇත. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් තේ වගාව සහ තේ දළු නෙලීමේ කටයුතු සඳහා තාවකාලිකව බලපෑ හැකිය. | වැදගත් |
| 7.2.4.2 කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිලි වල ඉරිතැලීම් විය හැකි බලපෑම<br><br>ඉදිකිරීම් කටයුතු හේතුවෙන් තෙමහල් අධිකරණ ගොඩනැගිල්ල අවදානමට ලක්ව ඇති අතර කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉරිතැලීම් ඇති විය හැක. | වැදගත් |
| 7.2.4.3 භූමියට සහ අනාගත සංවර්ධන කටයුතුවලට ප්‍රවේශය අහිමි වීම<br><br>ආපදා අවම කිරීමේ කටයුතු අධිකරණ සංකීර්ණ ප්‍රදේශය කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර, ඉහළ බෑවුම් සහිත ආපදා අවම කිරීමේ ස්ථානය පෞද්ගලික ඉඩමකි. එබැවින්, ඉඩමට ප්‍රවේශය අහිමි වීම හෝ වටිනා භාවිතයන් අහිමි වීම සම්බන්ධයෙන් ඉඩම් හිමියන්ට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත. | වැදගත් |
| 7.2.4.4 ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම්<br><br>බෑවුම් ප්‍රදේශයේ තේ සහ කුරුඳු වගාව ඉදිකිරීම් අදියරේදී බාධා ඇති වේ. එබැවින් ආදායමට ඇති බලපෑම තාවකාලිකව බලපානු ඇත. | වැදගත් |

| | |
|---|---|
| 7.2.4.5 සේවා සැපයීම කෙරෙහි ඇති වන බලපෑම (ජල සැපයුම, අපජලය, විදුලිය)<br>අස්ථායී බෑවුමේ ඉහළ කොටස හරහා විදුලි රැහැනක් සහ ජල සැපයුම් මාර්ගයක් ගමන් කරන අතර, ඉදිකිරීම් අතරතුර තවදුරටත් බෑවුම් චලනය සිදුවුවහොත් එය අවදානමට ලක් විය හැකිය. මෙම විදුලිය සහ ජල සැපයුම් මාර්ග වලට සිදුවන ඕනෑම හානියක් හෝ බාධාවක් අවට නිවාසවලට සහ අධිකරණ සංකීර්ණ මෙහෙයුම්වලට බලපෑ හැකිය. | **අතිශයින් වැදගත්** |
| 7.2.4.6 පහසුකම් හා ආරක්ෂාව අහිමි වීමෙන් ඇතිවන බලපෑම<br>ඉදිකිරීම් අදියරේදී, අධිකරණ සංකීර්ණයේ පිවිසුම් මාර්ගය නිතර ගමන් කරන යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදියෙන් අවහිර වනු ඇත. | වැදගත් |
| 7.2.4.7 කඳවුරු සහ ව්‍යාපෘති භූමිය ස්ථානගත කිරීමේ අවශ්‍යතා<br>කඳවුරු භූමිය තෝරා ගනු ලබන්නේ ප්‍රජාවගේ අසල්වැසි ප්‍රදේශයෙනි. නිසි කඳවුරු කළමනාකරණයක් නොමැති නම්, එය කම්කරු ගැටලු , ප්‍රජාව සමඟ සමාජ ගැටලු, ප්‍රජාව සමඟ පොදු සම්පත් සඳහා ගැටුම්, අපහසුතා, සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ගැටලු රැසක් ඇති කිරීමට හේතු විය හැකිය. තාවකාලික කඳවුරු ඉදිකිරීම් ස්ථානයට ආසන්නයේ පිහිටුවන්නේ නම්, ඝන අපද්‍රව්‍ය සහ මලාපවහන කළමනාකරණය ගැටලුවක් වනු ඇත. එබැවින්, බලපෑම් සැලකිය යුතු ය. | වැදගත් |
| 7.2.4.8 සහ කාර්ය මණ්ඩලය / ව්‍යාපෘති භූමිය අවට ජීවත් වන පුද්ගලයින් අතර සබඳතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව<br>මෙම ස්ථානයේ ඉදිකිරීම් සේවකයින් විවිධ සමාජ පසුබිම්වලින් සහ බොහෝ විට දරිද්‍රතාවයෙන් පෙළෙන විවිධ භූගෝලීය ප්‍රදේශවලින් පැමිණෙනු ඇත. සාමාන්‍යයෙන්, ඔවුන් දුර්වල අධ්‍යාපනික සහ සමාජීය පසුබිමක් ඇති අය වෙති. එවැනි ප්‍රජාවන්ට අසල්වැසි ප්‍රජාව කෙරෙහි ආතතියක් ඇති කරන පුළුල් පරාසයක සමාජ ගැටළු තිබිය හැකිය. එවැනි ගැටළු වලට සම්බන්ධ වන සේවකයින් දුර්ලභ වුවද, නොසලකා හැරිය නොහැක. | **අතිශයින් වැදගත්** |
| 7.2.4.9 ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව<br>කම්කරුවන් වැටීමේ අවදානමට නිරාවරණය විය හැකිය. පාෂාණ බිඳ වැටීම වුවහොත් මාරාන්තික තුවාල සිදුවිය හැකිය. ඔවුන් අස්ථායී බෑවුමකින් වැටීමේ අවදානමකට ද මුහුණ දිය හැකිය. සීමිත වැඩබිම් තුළ බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ භාවිතා කළ හැකිය. වාහන සහ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අනතුරු වලින් සිදුවන අනතුරු අවධානම මෙම ස්ථානයේ ඉතා වැදගත් වේ. ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුට අඩු වයස් සේවකයින් (ළමුන්) යෙදවිය හැකි අතර එය අවදානම් සහිත වන අතර බරපතල අනතුරු සහ තුවාල ඇති කළ හැකිය. | **අතිශයින් වැදගත්** |
| 7.2.4.10 ඉදිකිරීම් කටයුතු මගින් මහජනතාවට ඇතිවන ආරක්ෂාව: මගීන් සඳහා පවතින ඉහළ අවදානම<br>ඉදිකිරීම් අදියරේදී ප්‍රජාව සහ කාර්ය මණ්ඩලය ගමන් කරන මාර්ගය නිතර ගමනාගමනය වන යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදියෙන් අවහිර වනු ඇත. අවට ප්‍රජාවට සහ අධිකරණ කාර්ය මණ්ඩලය වෙනත් අරමුණු සඳහා ස්ථානයට ඇතුළු වීමට විශේෂ අවශ්‍යතාවයක් නොමැත. ඉදිකිරීම් සඳහා ලෝහ, වානේ වැනි ද්‍රව්‍ය භාවිතා කළ හැකි අතර ඒවා නුසුදුසු ගබඩා කිරීම සහ හැසිරවීම යටතේ හානි කළ හැකිය. කෙසේ වෙතත්, සාමාන්‍ය පුද්ගලයින් අනවසරයෙන් ඇතුළුවීම හිතාමතා හෝ නොදැනුවත්ව සිදු කළ හැකි අතර, යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය හෝ පිපිරුම් ද්‍රව්‍ය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඔවුන් අවදානමට ලක් විය හැකිය. විශේෂයෙන් නඩු භාණ්ඩ ගබඩා කර ඇති ගොඩනැගිල්ල තෙමහල් ගොඩනැගිල්ලට යාබදව පිහිටා ඇති බැවින්, අනවසර පුද්ගලයින්ට එම ප්‍රදේශයට ඇතුළුවීම සපුරා තහනම් කළ යුතුය. | **අතිශයින් වැදගත්** |

## 8. ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය

වගුව 2. ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය

| **අවදානම** | **බලපෑමට ලක් වූ කණ්ඩායම** | **අවදානම් මට්ටම** |
|---|---|---|
| 1. සීමිත ඉඩක වැඩ කිරීමේදී අනතුරු වලට මුහුණ දීම | කම්කරුවන් | ඉතා ඉහළ |
| 2. ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කිරීම | කම්කරුවන් | පහළ |
| 3. ඉදිකිරීම් භූමියේ සිට පාසල් පරිශ්‍රයට අපද්‍රව්‍ය (කුණු, බෝතල් සහ ආහාර) විසි කිරීම | කම්කරුවන් | ඉහළ |
| 4. රාත්‍රී කාලයේ සිදු කරන ඉදිකිරීම් වලදී අනතුරු වලට මුහුණ දීම | කම්කරුවන් | පහළ |

| | | |
|---|---|---|
| 5. ඉදිකිරීම් කටයුතු වලින් සිදුවන අනතුරු සහ මාර්ගයට ආසන්නව තබා ඇති ද්‍රව්‍ය | කම්කරුවන් | ඉහළ |
| 6. අස්ථායී ප්‍රදේශයේ ජලයෙන් යටවීම | කම්කරුවන් | ඉතා ඉහළ |
| 7. ඉදිකිරීම් අදියරේදී බඹර ප්‍රහාර | කම්කරුවන් / අවට ප්‍රජාව | ඉහළ |
| 8. පිපිරීම්/පිපිරවීම් හේතුවෙන් ජනනය වන පාෂාණ කොටස් නිසා ඇතිවන තුවාල | කම්කරුවන් / අවට ප්‍රජාව | පහළ |
| 9. විදුලි රැහැන්, සංඥා රැහැන් වලට යාබදව වැඩ කිරීම | කම්කරුවන් | ඉහළ |
| 10. වැඩබිම් - දුර්වල දෘශ්‍යතාවයෙන් වැඩ කිරීම | කම්කරුවන් | ඉහළ |
| 11. හුදකලා වැඩ කිරීම | කම්කරුවන් | ඉහළ |
| 12. හදිසි ඉවත් කිරීම | කම්කරුවන් | ඉහළ |
| 13. ආන්තික කාලගුණික තත්ත්වයන් (සුළං, වැසි, මීදුම ආදිය) | කම්කරුවන් | ඉහළ |

## 9. සැලකිය යුතු පාරිසරික හා සමාජ බලපෑම්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ (NBRI) හි විශේෂ අවධානයක් අවශ්‍ය වන පාරිසරික, සමාජීය බලපෑම් හෝ අවදානම් තත්වයන්.

### 9.1 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය :කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කරුණු

අස්ථායී වී ඇති බෑවුම් ප්‍රදේශයක අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂා කරණ බැවින් බෑවුමේ අස්ථායීතාවයේ ක්‍රියාකාරීත්වය නිසා ඉදිකිරීම් ශ්‍රම බලකාය මුහුණ පෑ හැකි අවදානම ඉහළ ය. ESMF හීදී එවන් පොදු E & HS ගැටළු සාකච්ජා කර ඇත. ඉදිකිරීම් වැඩ බිමෙහි සේවක ආරක්ෂක අවශ්‍යතාවයන් ලංසු පත්‍රිකාවේ 2003 කොටස: වැඩ කරණ තත්වයන් සහ ප්‍රජා සෞඛ්‍යය හා ආරක්ෂාව හි 2003 5: ආරක්ෂක උපකරණ සහ ඇඳුම් යන යටතේ වඩාත් විස්තර කර ඇත.

### 9.2 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම

වැඩ කරණ තත්ත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව චක්‍ර ලේඛනයේ 2003.3 වගන්තියට අනුව ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීම සවිස්තරාත්මකව දක්වා ඇත.

## 10. පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESMP)

7 සහ 8 වැනි කොටස් වලදී හඳුනාගන්නා ලද බලපෑම් සහ අවදානම් විශේෂයෙන් සලකා බලමින් එම බලපෑම් සහ අවදානම් තත්වයන් කළමනාකරණය කිරීමට හෝ අවම කිරීමේ ක්‍රියාමාර්ග. මෙය ESMP හි ඇති විශේෂිත නිදෙර්ශ සහ අවශ්‍යතා වල ඇතුළත් වනු ඇත.

### 10.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

මෙම ස්ථානයේ ව්‍යාපෘති පාදක නැවත පදිංචි කිරීමක් නොමැත.

### 10.2 පදිංචි ජනතාව ඉවත් කිරීම

මෙම ස්ථානය සඳහා ව්‍යාපෘති පදනම් වූ ඉවත් කිරීම් අවශ්‍ය නොවේ.

### 10.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය)

හානියට පත් ව්‍යුහයන්, පහසුකම් හෝ යටිතල පහසුකම් නොමැත. (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය)

### 10.4 ව්‍යාපෘතිය ක්‍රියාමාර්ග හේතුවෙන් දේපල/භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ගෙවීම

ව්‍යාපෘති ක්‍රියාමාර්ග හේතුවෙන් දේපළ/භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැත.

### 10.5 පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම

අධිකරණ පරිශ්‍රය තුළ පිහිටා අස්ථායී පාෂාණ භූමි කොටසකින් ඇති විය හැකි අවදානම් පිළිබඳව අවට ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන්, විශේෂයෙන් අධිකරණ කාර්ය මණ්ඩලය, අවට පදිංචිකරුවන් සහ අවට මාර්ගය භාවිතා කරන මඟීන්.

10.6 සැළසුම් මත පදනම් වු පාරිසරික සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම

මෙම ව්‍යාපෘති භූමිය ග්‍රාමීය වටපිටාවක් සහිත සෞන්දර්යාත්මක සුන්දර, පරිසර සංවේදී, ස්වභාවික පරිසරයක පිහිටා ඇත. එබැවින්, පාරිසරික හා සමාජීය වශයෙන් වැදගත් සැලසුම් සලකා බැලීම් අනුගමනය කිරීම නිර්දේශ කරනු ලැබේ. *යොමු වගුව 3; සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම*

වගුව 3. සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම

| සැළසුම් අංගය | මෙම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා සලකා බැලීම වන නිර් දේශිත මට්ටම. |
|---|---|
| i. ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ත ලෙස සැළසුම් කරණය<br>වෘක්ෂලතාදිය සමූහ වශයෙන් එළිපෙහෙළ කිරීම සහ වැඩුණු ශාඛ විශේෂ අවම සංඛ්‍යාවක් ඉවත් කිරීම වැළැක්වීම සඳහා ව්‍යාපෘති විශේෂිත සැලසුම් සලකා බැලිය යුතුය. වැදගත් ශාඛ විශේෂ හමු වුවහොත් ශාඛ සංරක්ෂණය කිරීම සලකා බැලීමට ප්‍රමාණවත් අවධාරණයක් ලබා දිය යුතුය. කෙසේ වෙතත්, පසෙහි චලනයන් හේතුවෙන් ප්‍රදේශයේ පහළ බෑවුම්වල වෘක්ෂලතාදිය විනාශ විය. | ඉහල |
| ii. ව්‍යාපෘති ස්ථානය සැලසුම්<br>ව්‍යාපෘති ස්ථානය සැලසුම් කිරීමේදී පාෂාණ පතනය වීම නැවත සක්‍රීය විය හැකි ආකාරය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. එසේම, ව්‍යාපෘති ස්ථානය පිහිටා ඇත්තේ ඉතා සීමිත බෑවුම් සහිත ඉඩ ප්‍රමාණයක වන අතර යාබද අධිකරණ ගොඩනැගිල්ල පිටුපස ඉහළ අවදානම් සහිතයි. පාෂාණ පතනය වන අනතුරුදායක කලාපවල ස්ථාපනය නොකළ යුතුය. ඉදිකිරීම් කාලය තුළ පුහුණු ධජ නිලධාරියෙකු හෝ ආරක්ෂක නිලධාරියෙකු තබා ගැනීම ඉතා අවශ්‍ය වන අතර කොන්ත්‍රාත්කරුගේ ශ්‍රම බලකාය, සහ අනෙකුත් වගකිවයුතු නිලධාරීන් අතර නිසි සන්නිවේදනය පවත්වා ගත යුතුය. | ඉතා ඉහල |
| iii. වාසස්ථාන සම්බන්ධතා සහ සත්ත්ව මංපෙත්<br>ස්ථිර ව්‍යුහයන් සඳහා හෝ ප්‍රවේශය සඳහා පාරිසරික වශයෙන් බිඳෙන සුළු වාසස්ථානවල විශාල වෘක්ෂලතා කොටස් එළි කිරීමට අවශ්‍ය නම්, නැතහොත් ගැඹුරු කාණු ආදිය සෑදීමට අවශ්‍ය නම්, බලපෑම් දේශීයකරණය වුවද, වාසස්ථාන සම්බන්ධතා විශේෂාංග, සත්ව මංපෙත් සහ වෘක්ෂලතා තීරු ආදිය සැලසුම්වලට ඇතුළත් කළ යුතුය. | අවම |
| iv. ජල සම්පත සංරක්ෂණය<br>මතුපිට සහ භූගත ජලය යන දෙකම නිස්සාරණය කිරීම ඇතුළත් නම්, නිස්සාරණය කරන ලද ජලය සාපේක්ෂව හොඳ තත්ත්වයේ පවතී. මෙම නිස්සාරණය කරන ලද ජලය අසල්වැසි ප්‍රජාවන්ට ගෘහාශ්‍රිත අරමුණු සඳහා ජල ප්‍රභවයක් ලෙස සැලකිය හැකිය. | ඉහළ |
| v. ස්වභාව සෞන්දර්යාත්මකව ගැලපෙන සැළසුම් සලකා බැලීම<br>සෞන්දර්යාත්මකව සංවේදී පරිසරයන්හි සැලසුම්, දෘශ්‍ය වශයෙන් සිදුවන දූෂණය අවම මට්ටමක තබා ගැනීම සඳහා ස්වභාවික පරිසරය සමඟ මුසු වන ව්‍යුහයන් සලකා බැලිය යුතුය. ප්‍රදේශය සංචාරක ආකර්ෂණයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඉදිකිරීම් කටයුතුවලදී හරිතකරණය භාවිතා කළ හැකිය. සුදුසු අවදානම අවම කිරීමේ ව්‍යුහයන් සැලසුම් කිරීම සඳහා භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පියාගේ සේවය වැදගත් විය හැකිය | ඉහළ |
| vi. හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම<br>අවදානම අවම කිරීමේ කටයුතු බොහොමයක් පාරිසරික වශයෙන් සංවේදී වාසස්ථානවල සිදු කරනු ලබන බැවින්, සැලසුම්වලදී හැකිතාක් හරිත පාරිසරික සැලසුම් සලකා බැලීම අනුමත කරනු ලැබේ. උදා: බාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම, පරිසරයේ විශේෂ විවිධත්වය පවත්වා ගැනීම සඳහා ශාක සංයෝජනය සහ ආක්‍රමණශීලී විශේෂ ඇතුළත් කිරීම වැළැක්වීම යනාදිය. | ඉහළ |
| vii. සමාජීය හා සංස්කෘතික ලක්ෂණ සංරක්ෂණය කිරීම<br>දේශීය සංස්කෘතීන් සහ උරුමයන් ශක්තිමත් වන්නේ ඒවා පවත්වා ගෙන යන ස්වභාවික පරිසරය සමඟ ඇති සමීප සම්බන්ධතා මගිනි. එබැවින්, ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කළ යුත්තේ දේශීය සංස්කෘතිය සහ සමාජීය අංශ සලකා බලමින්, ව්‍යාපෘති ක්‍රියාකාරකම් අතරතුර ඒවා ශක්තිමත් කිරීමට අවස්ථා ලබා දෙමිනි. | අවම |

| | |
|---|---|
| viii. සේවකයින් සහ අවට ප්‍රජාවගේ ආරක්ෂාව<br>මෙම ඉදිකිරීම් භූමිය මාර්ගයට ඉතා ආසන්නව පිහිටා ඇති බැවින් ඉදිකිරීම් අදියර තුළ විශේෂයෙන් ශ්‍රම බලකාය අනතුරු තත්ත්වයන්ට මුහුණ දිය හැකිය. අනවසරයෙන් ඇතුළුවීම සහ නොදැනුවත්කම හේතුවෙන් මෙම භූමිය අවට දරුණු අනතුරු ඇති විය හැකිය. ඉදිකිරීම් අදියරේදී නාය යම් හෝ භූමිය ගිලා බැසීම් සක්‍රියවීම් සිදුවිය හැකි අතර එමගින් කම්කරුවන් සහ ප්‍රජාවට තර්ජනයක් විය හැකිය. එබැවින් ආරක්ෂාව සඳහා විශේෂිත වූ බාල්ක, ආරක්ෂිත දැල් වැනි සැලසුම් මත පදනම් වූ ආරක්ෂණ සලකා බැලීම් සැලකිල්ලට ගත යුතුය. | ඉතා ඉහල |
| ix. බාදනය පාලන ව්‍යුහයන්<br>වැසි සමයේදී මෙම ජලාපවහන ව්‍යුහ වල ජලය ගලායාම සැලකිය යුතු ලෙස ඉහළ යා හැකි අතර මෙය බැවුම් බාදනය වීමට හේතු විය හැක. එබැවින් ස්වභාවික ප්‍රවාහවලට ඇතුළු වන බාදන ප්‍රවාහයන් අවම කිරීම සඳහා ප්‍රවාහ වේග අවම කරන උපක්‍රමයන් ප්‍රමාණවත් ලෙස සැලසුම කළ යුතුය. නාය යාම අවම කිරීමේ ස්ථානයට ආසන්නයේ ඇළ දොළ සහ බෝක්කු තිබේ නම් මෙය සැලසුමේ කොටසක් ලෙස ඇතුළත් විය යුතුය. | අවම |
| x. පසුකාලීන නඩත්තු හා මෙහෙයුම් අවශ්‍යතා අවම වන සැලසුම්<br>ජලාපවහන කළමනාකරණය සඳහා ගුරුත්වාකර්ෂණ කාණු වැනි නිෂ්ක්‍රීය ශිල්පීය ක්‍රම අවදානම් අවම කිරීම සලකා බැලිය යුතුය. කාණු අවහිර වීම වැළැක්වීම සඳහා නිවැරදි නල විෂ්කම්භය, සිදුරු විෂ්කම්භය සහ තැබීමේ කෝණ සැලකිය යුතුය. කාණු ජලය ස්වාභාවික ප්‍රවාහ වෙත යොමු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, අවම නඩත්තු ව්‍යුහයන් සහ බාදන බලවේග අවසාදිත රඳවා ගැනීමේ පද්ධති ආදියට ඔරොත්තු දෙන සැලසුම් සැලකිය යුතුය. ඉහළ කල්පැවැත්මක් සහිත කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීම සඳහා ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිතා කරන්නේ නම්, විබාදන වැළැක්වීමේ ශිල්පීය ක්‍රම විශේෂයෙන් සලකා බැලිය යුතුය. | ඉහල |

### 10.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම

#### 10.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන්

පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලු නායයාම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ කටයුතු වල ක්‍රියාකාරිත්වයට හේතු වේ. එබැවින් ඉදිකිරීමේදී වන බලපෑම අවම කිරීම කොන්ත්‍රාත්කරුගේ යුතුකමකි. කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු පත්‍රිකාවේ ඇතුලත් කර ඇති ***"පාරිසරික, සමාජ, සෞඛ්‍ය සහ ආරක්ෂණ (ES & HS) කළමනාකරණයට අනුකූලව ඉදිකිරීම් අදියරේදී කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාව"*** කෙසේ විය යුතුද යන්න පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණය ආයතනය විසින් නිර්දේශ කර ඇත. මෙම කොටස සඳහා අදාළ අංශවල ගුණාත්මක බව දැක්වෙන ප්‍රධාන කොටස් පහත දක්වා ඇත (වගුව 4). විස්තර සඳහා, ESMP ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා යොමු කළ යුතුය.

*යොමු වගුව 4; පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන් ES & HS*

වගුව 4. පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන් ES & HS

| **පාරිසරික සමාජයීය කළමනාකරණ සැළසුමට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දක්වන එකඟතාවය** | **අයිතමය** | **ව්‍යාපෘතිය සඳහා අදාලත්වය** |
|---|---|---|
| **2002. පාරිසරික හා සමාජ අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩ බිම තුල ගබඩා කිරීම | අතිශයින්ම අදාල වේ |
| 2002.2 2) | ශබ්ධය සහ කම්පන | අතිශයින්ම අදාල වේ (අධිකරණ කාර්ය මණ්ඩලය) |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරිතැලීම් සහ හානි සිදුවීම | අදාල නොවේ |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | අදාල වේ (අවට ප්‍රජාව සහ මගීන්) |
| 2002.2 5) | කසල බැහැර කිරීම | අතිශයින්ම අදාල වේ (අවට ප්‍රජාව) |
| 2002.2 6) | දූවිලි පාලනය | අතිශයින්ම අදාල වේ (අවට ප්‍රජාව සහ මගීන්) |
| 2002.2 7) | ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කසල ප්‍රවාහනය | අතිශයින්ම අදාල වේ |
| 2002.2 8) | ජලය | අතිශයින්ම අදාල වේ |

| | | |
|---|---|---|
| 2002.2 9) | ශාඛ සහ සතුන් | අදාල වේ |
| 2002.2 10) | භෞතික සහ සංස්කෘතිකමය සම්පත් | අදාල නොවේ |
| 2002.2 11) | පාංශු ඛාධනය | අදාල වේ |
| 2002.2 12) | පස සමග මිශ්‍ර වීම | අදාල වේ |
| 2002.2 13) | පොලොව හැරීම | අදාල වේ |
| 2002.2 14) | ගල් කොරි ක්‍රියාකාරකම් | අදාල නොවේ |
| 2002.2 15) | නඩත්තු වාහන සහ යන්ත්‍රෝපකරණ | අදාල වේ |
| 2002.2 16) | මහජන පීඩා | අතිශයින්ම අදාල වේ (අවට ප්‍රජාව සහ මගීන්) |
| 2002.2 17) | උපයෝගීතා සේවා හා පහසුකම් | අතිශයින්ම අදාල වේ |
| 2002.2 18) | දෘෂ්‍ය පරිසරය වැඩිදියුණු කිරීම | අදාල වේ |
| 2002-5. පාරිසරික අධීක්ෂණය | මූලික සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරිතැලීම් සමීක්ෂණ) | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | ඉදිකිරීම් අතරතුර සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරිතැලීම් සමීක්ෂණ) | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | මෙහෙයුම් කාලය තුල වැඩබිම් සමීක්ෂන | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | වාර්තා තැබීම හා පවත්වාගෙන යාම | අදාල වේ |
| **2003. වැඩබිම් කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂක ක්‍රම සංවිධානය සහ සන්නිවේදනය | අතිශයින්ම අදාල වේ (අනාරක්ෂිත බෑවුම, බර යන්ත්‍රෝපකරණ) |
| 2003.3 | ළමා ශ්‍රමය හා බලකිරීම | අදාල වේ |
| 2003.4 | ආරක්ෂාව පිළිබඳ වාර් තා සහ අනතුරු සහ ඒ පිළිබඳ දැනුම්දීම | අවම |
| 2003.5 | ආරක්ෂක උපකරණ සහ ඇඳුම් පැලඳුම් | අතිශයින්ම අදාල වේ |
| 2003.6 | ආරක්ෂක තත්ත්වය පරික්ෂාව | අතිශයින්ම අදාල වේ |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | අතිශයින්ම අදාල වේ |
| 2003.8 | සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ පුහුණුව | අතිශයින්ම අදාල වේ |
| 2003.9 | යන්ත්‍රෝපකරණ සහ සුදුසුකම් ලත් පුද්ගලයින් | අදාල වේ |

***අදාල වේ*** *: ඕනෑම ඉදිකිරීම් ප්‍රදේශයක් සඳහා මෙය අදාල කරගත හැක. (* ESMP)
***අතිශයින්ම අදාල වේ*** *: අදාල ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී ලෙස නිර්මාණය කරණ ලද පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම් සඳහා තහවුරු කිරීමට කොන්ත්‍රාත්කරු විශේෂයෙන් පාරිසරික ක්‍රමවේදයක් ලෙස අවදාරණය කළ යුතුය.*
***අදාල විය හැකිය*** *: ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර ඉදිකිරීම් ප්‍රදේශයේ අදාල අංශයන් අවධානය යොමු වුවහොත් පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම් මගින් ක්‍රියාත්මක කල හැක.*
***අදාල නොවේ*** *: අනාවරණය වූ කොන්දේසි මත මෙම ඉදිකිරීම් ප්‍රදේශය ට අදාල නොවේ.*
***විකල්ප:*** *අවශ්‍යතාවයන් මත ක්‍රියාත්මක වේ.*
***ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී වූ අධීක්ෂණ සැලසුම් යොමු කිරීම:*** *ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී වූ අධීක්ෂණ සැලසුම්වලට අනුව කොන්ත්‍රාත්කරු අධීක්ෂණ කටයුතු සිදු කිරීමට බැදී සිටී.*
***මූලාශ්‍ර :*** *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරු හා පාරිසරික හා සමාජීය කළමනාකාර සැළසුම සමග ඇති බැදීම*

10.7.2 නාය යන ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම

ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අපදා අවම කිරීමේ පියවරයන් පහත සඳහන් පරිදි වේ. *යොමු වගුව 5; ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනු ලබන පියවර*

වගුව 5. ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනු ලබන පියවර

| හානි අවම කිරීමේ අයිතමය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියර | වගකීම |
|---|---|---|
| i. ප්‍රමුඛ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ ගැටළු<br><br>වැඩබිමේ සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ වැඩ කිරීමට සිදු වන බැවින්, ESMP පිළිබඳ කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීමේ 2003 වගන්තියේ දක්වා ඇති " සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව " යටතේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ මෙම නිර්දේශයන් නිසි සංවිධානයක් සහ ආරක්ෂක නිරීක්ෂණ ක්‍රමයක් තුළ අනුගමනය කළ යුතුය.<br>• ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර විශේෂ වෘත්තීයමය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ සැලැස්මක් සකස් කර ගත යුතුය.<br>• සම්මත සේවක ආරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම.<br>• ආරක්ෂිත පාවහන්, හිස්වැසුම්, ආරක්ෂිත ඇඳුම් ඇස් කණ්ණාඩි වැනි පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) සැපයීම.<br>• සේවකයින්ට පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දීම.<br>• ප්‍රධාන ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට පෙර උපද්‍රව විශ්ලේෂණය සිදු කිරීම සහ හඳුනාගත් එවැනි උපද්‍රව සඳහා ප්‍රමාණවත් අවම කිරීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම/සැපයීම.<br>• බඹර කූඩු ආදිය එම ආසන්නයේ පිහිට තිබේ නම්, සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඉවත් කිරීමේ මධ්‍යස්ථාන භාවිතා කිරීම අනිවාර්ය වේ.<br>• තවද, අස්ථායී බිම්වල අවදානම අවම කිරීමේ කටයුතු සිදු කිරීම වැසි සමයේදී අධික අවදානමක් සහිත වන බැවින්, වර්ෂාව පවතින කාලයේදී සහ මීදුම් සහිත අවස්ථාවලදී ප්‍රමාණවත් කාල සීමාවක් සඳහා එම කටයුතු නතර කළ යුතුය | ඉදිකිරීම් කාලය තුළ | PMU ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| ii. යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය ප්‍රවාහනය<br><br>ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහන කාලසටහන පිළිබඳව මගීන් සහ සේවකයින් දැනුවත් කළ යුතුය. ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය හේතුවෙන් අධිකරණ ගොඩනැගිල්ලට හෝ ප්‍රවේශ මාර්ගයට හානි සිදු නොවිය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | PMU ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| iii. ඉදිකිරීම් අතරතුර බාදන බලපෑම් අවම කිරීම<br><br>වැසි සමයේදී භූමි පිරිසිදු කිරීම, බෑවුම් නැවත සකස් කිරීම, පාෂාණ ඉවත් කිරීම වැනි අවම කිරීමේ කටයුතු වළක්වා ගැනීම නිර්දේශ කෙරේ. එබැවින්, වියළි කාලයේදී ඉහළ බෑවුම ආපදා අවම කිරීමේ කටයුතු සිදු කිරීම අත්‍යවශ්‍ය වන අතර, හැකිතාක් තෙත් සමයේදී ඉහළ බෑවුම් ප්‍රදේශයේ එවැනි ක්‍රියාකාරකම් වළක්වා ගත යුතුය. ව්‍යාපෘති සැලසුම් කිරීමේ අදියරේදී මෙය සලකා බැලිය යුතුය. පාෂාණ ඉවත් කිරීම සඳහා ආරක්ෂිත දැල් හඳුන්වා දිය යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| iv. ආක්‍රමණශීලී විශේෂ<br><br>ශාක බාදන පාලන ව්‍යුහයන් භාවිතයෙන් වැළකී සිටිය යුතුය. දේශීය පරිසරයේ ඇති දේශීය ශාක, ශාක පාලනය සඳහා තෝරා ගත යුතුය. ශාකමය පාලන පියවර සඳහා භාවිතා කරන විශේෂ සඳහා අදාළ බලධාරීන්ගේ අනුමැතිය අවශ්‍ය වේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| v.ශබ්ද සහ කම්පන පාලනය<br>ශබ්ද සහ කම්පන ජනන ක්‍රියාකාරකම් අසල නිවාස, ඔවුන්ගේ ක්‍රියාකාරකම් සුමටව කර ගෙන යාමට බාධාවක් විය හැකිය. ව්‍යුහයන්ට හානි වීම වළක්වා ගැනීම සඳහා කම්පන ජනන ක්‍රියාකාරකම් නියමිත සීමාවන් තුළ සිදු කළ යුතුය. ඉදිකිරීම් කටයුතු හේතුවෙන් අධිකරණ ගොඩනැගිල්ලේ සහ යටිතල පහසුකම්වල ඉරිතැලීම් ඇති වී ඇත්නම් හෝ විශාල වී ඇත්නම් සුදුසු වන්දි ලබා දිය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| vi.ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම<br>ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එවැනි අපද්‍රව්‍ය ජනනය වන්නේ නම්, ඒවා සෝදා නොයන පරිදි නිසි ලෙස ගබඩා කර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් අනුමත කර ඇති ක්‍රියා පටිපාටීන්ට අනුව බැහැර කළ යුතුය. තවද ඉදිකිරීම් අපද්‍රව්‍ය අධිකරණ පරිශ්‍රයේ හි බැහැර නොකළ යුතුය. අනුමත ස්ථානවල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කොන්ත්‍රාත්කරු අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබා ගත යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| vii.සේවකයින් සඳහා ස්ථානීය සනීපාරක්ෂක පහසුකම්<br>කම්කරුවන් විවෘත භූමිය තුළ මලපහ කිරීම අවම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් ස්ථානය තුළ ශ්‍රම බලකාය සඳහා තාවකාලික සනීපාරක්ෂක පහසුකම් සලසා දිය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| viii. දූවිලි හා වායු පාලන ක්‍රමවේද<br>අධික දූවිලි අංශු ජනනය කරන ක්‍රියාකාරකම් ප්‍රමාණවත් සැලකිල්ලකින් සිදු කළ යුතුය. මෙම ස්ථානය සඳහා ප්‍රමාණවත් ලෙස ජලය ඉසීම නිර්දේශ කෙරේ. ගොඩනැගිල්ලේ පහළ බැවුමේ විවෘත වාතාශ්‍රය ආවරණය කිරීම සඳහා ආවරණ තිර (අධිකරණ ගොඩනැගිල්ල) නිර්දේශ කෙරේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| ix. ඉදිකිරීම් සඳහා ජලය භාවිතය<br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත ස්ථානවලින් පමණි. කොන්ත්‍රාත්කරු ප්‍රධාන විදුලි මාර්ගයන් විදුලිය භාවිතා කිරීමට අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳව ඔවුන්ට දැනුම් දී අවශ්‍ය අවසරය ලබා ගත යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| x. වැඩ කරන වේලාවන්, ආන්තික කාලගුණික තත්ත්වයන් යටතේ වැඩ කිරීම, සහ දුවර්ල දෘශ්‍යතාව යටතේ වැඩ කිරීම<br>ඉදිකිරීම් කටයුතු අධිකරණ කළමනාකරණයට අනුකූල විය යුතුය. ශබ්දය, කම්පනය සහ දූවිලි උත්පාදන කටයුතු අධිකරණ නඩු විභාග වේලාවෙන් පසුව සිදු කළ යුතුය. පොදු ස්ථානයක් තුළ ඉදිකිරීම් කටයුතු අතරතුර ඇතිවිය හැකි හදිසි අවස්ථා සඳහා කඩිනම්, සංවිධානාත්මක සහ ඵලදායී ප්‍රතිචාරයක් සහතික කිරීම සඳහා හදිසි ප්‍රතිචාර සැලැස්මක් ස්ථාපිත කළ යුතුය. ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීම සඳහා රාත්‍රී කාලයේ මෙහෙයුම් අවශ්‍ය නම්, එවැනි කටයුතු අධිකරණ කළමනාකාරිත්වයේ කැමැත්ත ඇතිව ප්‍රමාණවත් ආරක්ෂක පියවරයන් සමඟ සිදු කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| xi. යටිතල පහසුකම් මත බලපෑම<br>PMU හි අනුමැතියට අනුව ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර දුරකථන, විදුලිය සහ පොදු ජල මාර්ග ස්ථානගත කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| xii.ඉදිකිරීම් අතරතුර, දෘශ්‍ය දූෂණය අවම කිරීම සඳහා හොඳ ගෘහ පාලනයක් පවත්වා ගත යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| xiii. සේවක හැසිරීම් සංග්‍රහය<br>කොන්ත්‍රාත්කරු විසින් එකඟ වූ ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමෙන් ශ්‍රම බලකාය, අධිකරණ සංකීර්ණයේ නිලධාරීන් සහ අවට පදිංචිකරුවන් අතර ඇති විය හැකි ආරවුල් වළක්වා ගත යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| xiv. ඇතුල්වීම තහනම් කලාපය<br><br>නඩු භාණ්ඩ ගබඩා කර ඇති ගොඩනැගිල්ල, තෙමහල් ගොඩනැගිල්ලට යාබදව පිහිටා ඇත. එබැවින් එම ප්‍රදේශයට ඇතුළුවීම දැඩි ලෙස තහනම් කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| xv. ගිනි උවදුර<br><br>අධිකරණ කළමනාකාරිත්වය විසින් අවශ්‍ය පරිදි සිදුවිය හැකි ගිනි උවදුර වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරු විශේෂ පියවර ගත යුතුය. විදුලිය භාවිතා කරන්නේ නම් දැඩි සැලකිල්ලක් දැක්විය යුතුය. භාවිතයේ නොමැති විට විදුලි රැහැන් නිසි ලෙස අසුරා, විසන්ධි කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| xvii. සර්ප දෂ්ට කිරීම් කළමනාකරණය සහ හදිසි අනතුරු කළමනාකරණය<br><br>සර්ප දෂ්ට කිරීම සහ විෂ සහිත කෘමි ප්‍රහාර සඳහා නිසි හදිසි කළමනාකරණ පද්ධතියක් (රාජකාරියේ යෙදී සිටින විට ආරක්ෂිත පාවහන් පැළඳීම, සර්ප දෂ්ටයකදී ප්‍රථමාධාර, රෝහල්ගත කිරීම සහ සර්ප දෂ්ට කිරීම් කළමනාකරණ පහසුකම් ඇති නිවැරදි රෝහලට ඇතුළත් කිරීම පිළිබඳ දැනුවත් කිරීම ඇතුළත්ව) හඳුන්වා දිය යුතුය.<br>මෙවැනි ව්‍යාපෘති ස්ථාන වල සිදු වන අනතුරු බහුල බැවින් නිසි හදිසි කළමනාකරණ ඒකකයක් (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත ද්‍රව්‍ය, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) මෙම ස්ථානය සඳහා පවත්වාගෙන යා යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

10.7.3 ස්ථානයට අදාල විශේෂිත අධීක්ෂණ තත්ත්වයන්

ඉදිකිරීම් අදියර තුළ පහත සඳහන් අධීක්ෂණ සැලැස්ම නිර්දේශ කර ඇත. මීට අමතරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ සඳහන් කළ යුතු නිරීක්ෂණ ක්‍රියා පටිපාටිය ද ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරණ ලද ඉල්ලුම්පත තුළ ඔහුගේ නිපුණතා පිළිබඳ අදාළ ලේඛන සමඟ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ESMP වැඩපිළිවෙළ යොමු කරණු ඇත. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්විය යුතුය. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික සහ සමාජ කළමනාකරණ ක්‍රම පිලිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එය PMU ඒකකය මගින් අනුමත කිරීමට නියමිතය. *යොමු වගුව 6; පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම*

වගුව 6: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම

| අධීක්ෂණ අවශ්‍යතාවය | පරාමිතීන් | වාර ගණන |
|---|---|---|
| i. මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය | - |
| | ඉදිකිරීම් සිදු කිරීමට පෙර ආසන්න ප්‍රදේශයේ නිවාස වල පෙර ඉරිතැලීම් සමීක්ෂණය | වරක් * |
| | භූමියේ සිදුවන කම්පන | වරක් * |
| | වායු ගුණාත්මකභාවය: වායු අංශු | වරක් * |
| | පසුබිම් ශබ්දය මැනීම | වරක් * |
| ii. ඉදිකිරීම් අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | - |
| | අවදානම් ගොඩනැගිලි වල පූර්ව ඉරිතැලීම් නිරීක්ෂණය | ඉදිකිරීම් අතරතුර සැලකිය යුතු විස්ථාපනයක් නිරීක්ෂණය කළහොත් ** |
| | භූමියේ සිදුවන කම්පන | විදුම් යන්ත්‍රෝපකරණ, විදුම් වැඩ, හෝ භූ කම්පන ජනනය කරන ඕනෑම කාර්යයක් ක්‍රියාත්මක කිරීමේදී * |
| | ඉදිකිරීම් වල දී ඇති වන ශබ්දය | අධික ශබ්ද උත්පාදන කාලවලදී මසකට වරක් * |
| | වායු ගුණාත්මකභාවය: වායු අංශු | මසකට වරක් * |
| iii. වාහන මගින් සිදුවන විමෝචනය | සියලුම යන්ත්‍රෝපකරණ/වාහන මෙහෙයුම් කටයුතු සඳහා අදාළ වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය ලබා තිබිය යුතුය - උපදේශක පාශර්වයේ ස්ථානීය ES නිලධාරියා විසින් පරීක්ෂා කළ යුතුය. | |
| iv. අධීක්ෂණ ආයතනය | *මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි සහතික සහිත ස්වාධීන අධීක්ෂණ ආයතනයක් මගින් ඉරිතැලීම් පරීක්ෂණ හැර අනෙකුත් පරීක්ෂණ සඳහා යොදාගත යුතුය.<br>**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය :PMU විසින් පිලිගනු ලබන විශ්වාසී ආයතනයක් මගින් ඉරිතැලීම් පරීක්ෂණ කල යුතුය | |

| | |
|---|---|
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | **ජල මාර්ග වල ජලයේගුණාත්මකභාවය** – 2019 අංක 01 දරණ ජාතික පාරිසරික (පරිසර ජල තත්ව) රෙගුලාසි සමඟ සැසඳීම<br>**අධි අවදානම් ගොඩනැගිලි පිළිබඳ පූර්ව ඉදිකිරීම් ඉරිතැලීම් සමීක්ෂණය** - වෘත්තීමය වාර්තාව<br>**පොළවේ සිදුවන කම්පනයන්** - යන්ත්‍ර සූත්‍රවලින් ඇති වන පොළවේ කම්පනයන්,ඉදිකිරීම් අතරතුර හා වාහන වලින් ඇතිවන කම්පනයන්, මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව<br>**වට පිටාවෙන් ඇති වන ශබ්දය මැනීම** - මධ්‍යම පරිසර අධිකාරියේ අංක 924.1 1996 මැයි 01 දින විශේෂ ගැසට් පත්‍රය<br>**වායු ගුණාත්මකභාවය සම්බන්ධ කරුණු** - ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ අංක 1562/22 2008 අගෝස්තු 15 - විශේෂ විවේදනයේ සඳහන් අවම වායුගුණ තත්ත්වයන් |

## 11. පදිංචි ජනතාව සහ පාර්ශවකරුවන්ගේ උපදේශන - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්

### 11.1 මහජන උපදේශන

එල්.ඩබ්ලිව්. වික්‍රමසේකර, අවදානම් ඉඩම් හිමිකරු, උපදෙස් ලබාගෙන නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම්, ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සහ අරමුදල් සැපයීමේ යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කරන ලදී.

### 11.2 පාර්ශවකරුවන් සමග පවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකගතාවයන් හා නිර්දේශයන්

අධිකරණ සංකීර්ණයේ නඩු භාණ්ඩ භාරකරු දුමින්ද පතිරණ මහතා, ව්‍යාපෘති කටයුතු පිළිබඳව දැනුවත් කරන ලදී. ඔහු ආපදා අවම කිරීමේ අවශ්‍යතාවය පිළිගත් අතර ව්‍යාපෘතිය සඳහා ඔහුගේ පූර්ණ සහයෝගය ප්‍රකාශ කළේය.

## 12. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යෝග්‍යතා , කැමැත්ත ප්‍රකාශනය , එකඟතාව සහ අනුමත කිරීම

වගුව 7. බාධා ඉවත් කර ගැනීම්, විරෝධතා නොමැති බව, කැමැත්ත සහ අනුමත කිරීම්

| **අවශ්‍යතාවය / අනුමත කිරීම / ආයතනය** | **ව්‍යාපෘතියට අදාළත්වය** |
|---|---|
| 12.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | |
| දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට සිදුවනු ඇති අතර මෙහිදී ප්‍රධාන ඇමතිවරයා සහ දිස්ත්‍රික්කයේ වගකිව යුතු ආයතන සහභාගී වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හමුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ යුතු වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරියෙකු ව්‍යාපෘතිය පිළිබඳ විස්තර කරමින් එහි විවිධ පාරිසරික සහ සාමාජයීය ගැටළු ආදිය ගැන කරුණු ඉදිරිපත් කරණු ඇත. මෙම ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් මෙම රැස්වීමේදී ගනු ලබන නිර්දේශ මෙම පාරිසරක සහ සමාජයීය කළමනාකරණ සැලසුම ක්‍රියාවට නංවන විට සැලකිල්ලට ගැනෙනු ඇත. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | මෙම ව්‍යාපෘතියට කොටපොල ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය. |
| 12.2 ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය | |
| මධ්‍යම පරිසර අධිකාරිය | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වේ. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන රක්ෂිත වෙන්කිරීම් කලාපයක යටතේ හෝ තුළ මෙම ව්‍යාපෘති වැඩබිම පිහිටා නොමැති බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය | භූමි, පාෂාණ හා ඛනිජමය සුන්බුන් ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ අනුමැතිය ලබාගත යුතුය (අවශ්‍ය නම්, පමණි). |
| කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අපද්‍රව්‍ය ප්‍රවාහනය සහ බැහැර කිරීම වැනි කටුයුතු කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමැතිය ලබාගත යුතුය. |
| ලංකා විදුලිබල මණ්ඩලය | ව්‍යාපෘති භූමියේ විදුලිබල සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය අවශ්‍ය වේ. |

| | |
|---|---|
| ජාතික ශාක නිරෝධායන සේවය | ජෛව ව්‍යාපෘති කළමනාකරණය කරන ලද බැවුම් අවම කිරීම සඳහා අවශ්‍ය ශාක හෝ බීජ ශ්‍රී ලංකාවට ආනයනය කළ යුත්තේ 1999 අංක 35 දරණ පැලෑටි සංරක්ෂණ පනත යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්, අතිරේක අධ්‍යක්ෂක ජාතික ශාක නිරෝධායන සේවය, කටුනායක වෙතින් නිකුත් කරන ලද ශාක ආනයන බලපත්‍රයක අධිකාරිය යටතේ සහ එහි කොන්දේසි වලට අනුකූලවය. |
| 12.3 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබාගැනීම/නෛතික බැඳීම/ විරුද්ධත්වයක් නොමැති වීම | |
| අධිකරණ අමාත්‍යාංශය සහ ඉඩම් හිමියා (පෞද්ගලික) | ඉඩම් හිමිකරු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කිරීම, ව්‍යුහයන් ඉවත් කිරීමට, භූමියට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට එකගතාවය ලබා ගත යුතුය. |

අනුමැතීන් ලබා ගැනීම යොජිත කාල රාමුව වගු අංක 8න් දක්වා ඇත.

වගුව 8. අනුමැතීන් ලබාගැනීම සඳහා නියමිත කාල රාමුව

| අනුමැතීන් | මාසය 1 | | | | මාසය 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය1 | සතිය2 | සතිය3 | සතිය4 | සතිය1 | සතිය2 | සතිය3 | සතිය4 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමැතිය**<br>අයදුම් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම | — | — | — | — | — | | | |
| **සැළසුම් කමිටුවේ අනුමැතිය අයදුම් කිරීම**<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම | | — | — | — | — | | | |
| **වෙනත් අනුමැතීන්**<br>භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ<br>ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය (අවශ්‍යතාවය අනුව) | — | — | | | | | | |
| ඉඩම් හිමිකරුවන්ගේ අනුමැතිය/කැමැත්ත ලබාගැනීම | — | — | | | | | | |

## 13. දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය

මෙම ව්‍යාපෘති යේ බලපෑමට ලක්වූ ප්‍රජාව සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා උපදේශකවරුන් වන PMU හි ES නිලධාරි වරයා වගබලා ගත යුතුය. (*යොමුකිරීම: දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා නිර්දේශිත ක්‍රියා පටිපාටිය සඳහා පරිසර හා සමාජ කළමනාකරණ රාමුව)*

## 14. තොරතුරු අනාවරණය කිරීම

පහත 9 වගුවේ දැක්වෙන ආයතන සහ සංවිධාන අනුව ලකුණු කරණ ලද ආකෘති මගින් ES තොරතුරු අනාවරණය කිරීම PMU හි වගකීම වේ.

වගුව 9. තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු සන්නිවේදන ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘතිය සැලසුම් කිරීම (ඉදිකිරීම් ප්‍රදේශයේ තොරතුරු, සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය) | දිස්ත්‍රික් CEA, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන, ජා.ගො.ප.ආ දිස්ත්‍රික් කායර්ාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව.ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ වාර්තා සැපයීම, අනුමැතීන් හා එකඟතා |
| ii. පාරසරික හා සාමාජීය කළමනාකරණ සැලසුම | දිස්ත්‍රික් CEA, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව.ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ වාර්තා සැපයීම, අනුමැතීන් හා එකඟතා |
| iii. ප්‍රගති වාර්තා (මූලික අදියරේදී හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් CEA, AIIB හා වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන | ප්‍රගති සමාලෝචන රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාල වාර්තා භාර දීම. |
| iv. කම්කරුවන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය පාරිසරික යෝග්‍ය බව අදාල ඉදිකිරීම් භූමියේ සුපරීක්ෂණය | දිස්ත්‍රික් CEA, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, ජා.ගො.ප.ආ දිස්ත්‍රික් කාර්යාලය AIIB වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන | වාචික හා අවිවාචික සන්නිවේදනය, ආදාල වාර්තා භාරදීම |
| v. ES කාරණාවලට අදාළව ගත් තීරණ සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාම නිලධාරී, NBRI දිස්ත්‍රික් කාර්යාලය , AIIB සහ අදාළ පාර්.ශවයන් සුදුසු පරිදි | රැස්වීම්, අදාල වාර්තා භාර දීම. |
| vi. දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශව, AIIB | රැස්වීම්, වාචික හා අවිවාචික සන්නිවේදනය |

වගුව 10. තොරතුරු රැස්කිරීම සඳහා සම්බන්ධ කරගත් ආයතන සහ නිලධාරීන්

| දිනය | ආයතනය | තොරතුරු සඳහා සම්බන්ධ වන නිලධාරියා |
|---|---|---|
| 27/05/2026 | අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | ආර්.එම්.පී.ඩී රත්නායක මහතා, ඉංජිනේරු, (0712248664) |
| 22/11/2025 | මොරවක අධිකරණ සංකීර්ණය | දුමින්ද පතිරණ මහතා, නඩු භාණ්ඩ භාරකරු (0716893667 / 0412271289) |

**ඇමුණුම I: ව්‍යාපෘති  ප්‍රදේශයේ සහ අදහස් විමසීම් සිදුකරණ අතරතුර ලබාගත් ඡායාරූප**



*අධිකරණ සංකීර්ණයේ නඩු භාණ්ඩ භාරකරු දුමින්ද පතිරණ මහතා සමඟ උපදේශනය*

**ඇමුණුම II: පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු**

| ආයතනය | සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර | ඉදිරිපත් වූ සැලකිය යුතු කරුණු |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය | | ✓ ව්‍යාපෘතිය සඳහා අයදුම්පත පිරවීමට සහ එය ඉදිරිපත් කිරීම සඳහා මූලික තොරතුරු ප්‍රශ්නාවලියක් (BIQ) අවශ්‍ය වේ.<br>✓ හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස නායයෑම් වලින් ඇති වන අවදානම අවම කිරීමට ව්‍යාපෘතිය අදහස් කරන බැවින්, ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවේ.<br>✓ ව්‍යාපෘති ය ආරම්භ කිරීමට පෙර අවම කිරීමේ නාය යාම අවම කිරීමට අවශ්‍ය බව සඳහන් කර ඉල්ලීමක් කළ යුතුය.<br>✓ අවම කිරීමේ කටයුතු නියමිත ව්‍යාපෘතියක් තුළ නොමැතිව සංවේදී ප්‍රදේශයක ක්‍රියාත්මක කරන්නේ නම් අවම කිරීමේ කටයුතු පාලනය කරනු ලැබේ. |

**ඇමුණුම III: අධ්‍යාන කණ්ඩායම**

| නම | තනතුර | කාර්.ය භාරය |
|---|---|---|
| එස්. එම්. ඒ.එස් දිසානායක | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ /පරිසර අංශය /NBRI | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ |
| ප්‍රභාත් ලියනාරච්චි | විද්‍යාඥ / පරිසර අංශය /NBRI | පරිසර විද්‍යාඥ |
| ඒ.ජී.රන්දොඹගේ | ව්‍යාපෘති  සහකාර | ජනවිකාස දත්ත එකතු කිරීම සහ වාර්තාව සකස් කිරීම |

**ඇමුණුම IV: යොමු ලැයිස්තුව**


1. සාමාන්‍ය පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම සඳහා ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුගේ බැඳීම් -AIIB
2. පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව - ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය -AIIB
3. නැවත පදිංචි කිරීමේ සැලසුම් රාමුව - ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය -AIIB
4. කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ගස් කැපීම (පාලන) පනත
5. සංගණන හා සංඛ්‍යාලේඛන වාර්තාව (2012), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව